# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,585 — 1965 දෙසැම්බර් 15 වැනි බදාදා —1965.12.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

අංක 1965 ජී. 7 දරන ආහාර මිල ආඥාව — අතිරේක ආහාර ද්‍රව්‍ය

### මිල පාලන පනත

#### ආඥාව

(173 වන අධිකාරය වන) මිල පාලන පනතේ 3 (2) වන වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ගාල්ල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක තැන්පත් ගාර්දියේ පුංචිහේවාගේ බුද්ධදාස ද සිල්වා වන මම, මේ ආඥාවෙන්—

(i) 1965 නොවැම්බර් 15 දින අංක 14,558 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ වූ 1965 නොවැම්බර් 13 දින අංක ජී. 5 දරන ආහාර මිල ආඥාව වහාම බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි ;

(ii) මෙහි වූ උපලේඛනයේ 3 වන තීරයෙහි දැක්වෙන මුදල එකතු කරන ලද (173 වන අධිකාරය වන), මිල පාලන පනත යටතේ කොළඹ මහ නගර සභා ප්‍රදේශය තුළ තොග වෙළෙන්දෙකු විසින් විකිණිය හැකි උපරිම තොග මිල ලෙස එවකට නියම කර ඇති මිල, ඒ උප ලේඛනයේ 1 වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිත ව සඳහන් ද්‍රව්‍යයේ දළ බර හොණ්ඩරයක් ඒ උපලේඛනයේ 2 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය තුළ විකිණිය හැකි හා එයට ඉහළින් නො විකිණිය යුතු උපරිම තොග මිල විය යුතුලෙස වහාම.බල පැවැත්වෙන පරිදි නියම කරමි ;

(iii) මෙහි වූ උපලේඛනයේ 4 වන තීරයෙහි දැක්වෙන මුදල එකතු කරන ලද (173 වන අධිකාරය වන), මිල පාලන පනත යටතේ කොළඹ මහ නගර සභා ප්‍රදේශය තුළ සිල්ලර වෙළෙන්දෙකු විසින් විකිණිය හැකි උපරිම සිල්ලර මිල ලෙස එවකට නියම කර ඇති මිල, ඒ උප ලේඛනයේ 1 වන තීරයේ අනුරූෂ සටහනෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයේ ශුද්ධ බර රාත්තලක් ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය තුළ විකිණිය හැකි හා එයට ඉහළින් නො විකිණිය යුතු උපරිම සිල්ලර මිල විය යුතු ලෙස, වහාම බල පැවැත්වෙන පරිදි නියම කරමි ;

(iv) මෙම ආඥාවේ කාර්ය සඳහා—

(අ) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයක යම් ප්‍රමාණයක් නැවත විකිණීමේ කාර්‍ය සඳහා වූ යම් විකිණීමක් හෝ ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් වූ යම් විකිණීමක් තොග වශයෙන් වූ විකිණීමක් විය යුතු බවත්,

(ආ) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස දළබර හොණ්ඩරයකට අඩු යම් ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් වූ විකිණීමක් විය යුතු බවත්,

නියම කරමි ;

(v) මෙම ආඥාවෙන් වැඩිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක සමඟ මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිම තැනැත්තකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි ;

(vi) මෙම ආඥාවෙන් උපරිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ වාහනයක හෝ මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ සිය පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකු විසින්ම ඒ ද්‍රව්‍යයෙන් ප්‍රමාණවත් කොටසක් සුදුසු භාජනයක බහා එම ද්‍රව්‍ය සඳහා මෙම ආඥාවෙන් නියමිත උපරිම මිල උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිල සූචකයක හෝ මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධකොට එකී ද්‍රව්‍යය සහ ඒ සඳහා නියම කරන ලද උපරිම මිල යම් ගනුදෙනුකරුවකුට පැහැදිළිව පෙනෙන සේ ඒ ස්ථානයෙහි හෝ වාහනයෙහි ප්‍රදර්ශනය කළ යුතු බව නියම කරමි.

(vii) මෙම ආඥාවේ කාර්යය සඳහා "රාත්තල" හෝ "රා." යන්නෙන් ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර සැළකිය යුතු බව නියම කරමි ;

(viii) මෙම ආඥාවෙන් උපරිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකු හා ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින් ම ගැනුම්කරු ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;
(ආ) එම ද්‍රව්‍යයන් විකුණූ ප්‍රමාණය (බර අනුව) ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් විකිණීම තොග වශයෙන් ද, නැතහොත් සිල්ලර වශයෙන් ද යන බව ඇතුලත් කුවිතාන්සියක් ගැනුම්කරුට දිය යුතු බව නියම කරමි.

(ix) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණූ විට, ඒ විකුණනු ලැබූ ද්‍රව්‍යය යම් දෙයක ඔතනු ලැබේ නම් නැතහොත් බහාලනු ලැබේ නම්, එහි මිළත් ඒ උපලේඛනයේ 3 වන සහ 4 වන තීරයන්හි සඳහන් උපරිම මිළට ඇතුළත් විය යුතු බව නියම කරමි.

1965 දෙසැම්බර් 9 වන දින පෙ.ව. 10ට ගාල්ලේ දී අත්සන් කරන ලදී.

ජී. පී. බී. ද සිල්වා,
ගාලු දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක.

## උපලේඛනය

| 1 වන තීරය<br>ද්‍රව්‍යය | 2 වන තීරය<br>ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය | 3 වන තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් විකිණිය හැකි, කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිලට වඩා වැඩි අධිකය<br>රු. ශ. | 4 වන තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි, කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිලට වඩා වැඩි අධිකය<br>රු. ශ. |
|---|---|---|---|
| ලූනු (රතුලූනු සහ වික්බෙලාපූර් හැර වෙනත් වර්ග)<br>රතුලූනු<br>අර්තාපල් | බෙන්තොට සුළු නගර සභා සීමාව, ඉඳුරුව ගම්සභා සීමාව, පහල ගම්හය ගම්සභා සීමාව, කොස්ගොඩ ගම්සභා සීමාව, ඌරගස් මන් හන්දිය ගම්සභා සීමාව | 1 72 ... | 0 2 |
| කොත්තමල්ලි<br>උළුඳු (පියලි නොකල)<br>මුං ඇට<br>තෝර පරිප්පු<br>කඩල පරිප්පු<br>සියඹලා | එම ... | 2 72 ... | 0 2 |
| ලූනු (රතු ලූනු සහ වික්බෙලාපූර් හැර වෙනත් වර්ග<br>රතුලූනු<br>අර්තාපල් | ගාල්ලේ නගර සභා සීමාව සහ කඩවත් සතර, අම්බලන්ගොඩ පළාත් ආණ්ඩු සභාව, බලපිටිය සුළු නගර සභාව, වතුගෙදර සුළු නගර සභාව, ඇල්පිටිය සුළු නගර සභාව, හික්කඩුව සුළු නගර සභාව, දෙඩන්දූව සුළු නගර සභාව, අම්බනපිනිකහන ගම්සභාව, ගොලුවා මුල්ල–ඕමත්ත ගම්සභාව, කරන්දෙනිය ගම්සභාව, බටපොල ගම්සභාව, මාදම්පේ ගම් සභාව, වෙරගොඩ ගම්සභාව, ගෝනපිනු වල–මීටියාගොඩ ගම්සභාව, කොටගමුව–තිරානගම ගම්සභාව, රත්ගම ගම්සභාව, බද්දේගම ගම්සභාව සහ බෝපේ ගම්සභාව | .1 86 ... | 0 2 |
| කොත්තමල්ලි<br>උළුඳු (පියලි නොකල)<br>මුංඇට<br>තෝර පරිප්පු<br>කඩල පරිප්පු<br>සියඹලා | එම ... | 2 86 ... | 0 3 |
| ලූනු (රතුලූනු සහ වික්බෙලාපූර් හැර වෙනත් වර්ග)<br>රතුලූනු<br>අර්තාපල් | අහංගම සුළු නගර සභාව, අක්මීමන ගම්සභාව, හබරාදූව ගම්සභාව, කෝද්දගොඩ ගම්සභාව, කොට්ටව ගම්සභාව, පොල්පාගොඩ ගම්සභාව, නාගොඩ ගම්සභාව, පෝද්දල ගම්සභාව, වඳුරඹ ගම්සභාව, තෙලිකඩ–මාපුවාන ගම්සභාව, වැලිවිටිය–දිවිතුර ගම් සභාව, පිටිගල–වැයිහේන ගම්සභාව, පොද්දිවල-නියාගම ගම් සභාව සහ කතළුව ගම්සභාව | 2 05 ... | 0 2 |
| කොත්තමල්ලි<br>උළුඳු (පියලි නොකල)<br>මුංඇට<br>තෝර පරිප්පු<br>කඩල පරිප්පු<br>සියඹලා | එම ... | 3 05 ... | 0 3 |
| ලූනු (රතුලූනු සහ වික්බෙලාපූර් හැර වෙනත් වර්ග<br>රතුලූනු<br>අර්තාපල් | හිනිදුම ගම්සභාව, ඕපාත ගම් සභාව, නෙළුව ගම්සභාව සහ දෙල්ලව ගම්සභාව | 2 11 ... | 0 2 |
| කොත්තමල්ලි<br>උළුඳු (පියලි නොකල)<br>මුංඇට<br>තෝර පරිප්පු<br>කඩල පරිප්පු<br>සියඹලා | එම | 3 11 ... | 0 03 |

සැළකිය යුතුයි.—මේ මිල ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු ලෙස නියම කළ ඇති මිල නොවේ. ඒවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම මිල වන අතර ඊට ඉහළින් ඒ ද්‍රව්‍ය නොවිකිණිය යුතුය.

12–1014

සහල් සහ තිරිඟු පිටි

## 1950 අංක 29 දරණ මිල පාලන පනත

අංක ර/43/65 දරන මිල නියෝගය.
(ර/43/65)

### නියෝගය

රත්නපුර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් ජෝන් වින්සන් ඥානප්‍රගාසම් වන මම (173 වන අධිකාරිය වන) මිළ පාලන පනතේ 3(2) දරන වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව :—

(1) අංක 13,552 හා 6.3.63 දින දරන ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද සහල් සම්බන්ධ මගේ අංක ආර්/33/1963 හා 1.3.63 දින දරන මිළ නියෝගය හා අංක 13,726 හා 12.8.63 දින දරන ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද තිරිඟු පිටි සම්බන්ධ මගේ අංක ආර්/35/10/63 හා 6.8.63 දරන මිළ නියෝගයද මේ දැන් සිට අවලංගු කරමි.

(2) මේ මොහොතේ සිට මීට යාකොට ඇති උපලේඛනයේ පලවෙනි තීරයේ සඳහන් ප්‍රදේශ සීමාවන් තුළ එම උපලේඛනයේ 2 වෙනි තීරයේ නියමකර ඇති මිළ ගණන් ශුද්ධ බරින් සහල් හොන්ඩරයක් විකිණිය යුතු වැඩිම මිළ ගණන් වන අතර ඒ මිළ ගණන් වලට වඩා වැඩියෙන් තොග වශයෙන් සහල් නොවිකිණිය යුතු බව නියෝග කරමි.

(3) මේ මොහොතේ සිට මීට යාකොට ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශ සීමාවන්තුළ එම උපලේඛනයේ 3 වෙනි තීරයේ නියම කර ඇති මිළ ගණන්, ශුද්ධ බරින් සහල් රාත්තලක් විකිණිය යුතු වැඩිම සිල්ලර මිළ ගණන් වන අතර ඒ මිළ ගණන් වලට වඩා වැඩියෙන් සහල් නොවිකිණිය යුතු බව නියෝග කරමි.

(4) තවද මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) සහල් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වරකට ශුද්ධ බර හොන්ඩරයකට වඩා වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමකට හෝ විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) සහල් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර හොන්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිලගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම සහල් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බවත් නියම කරමි.

(6) තිරිඟු පිටි තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බරෙන් රාත්තල් 148 ක් මේ සමග ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශයන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ එහි 4 වෙනි තීරයේ සඳහන් කර තිබෙන මිල ගණන් වන අතරම ඒ මිළ ගණන්වලට වඩා වැඩියෙන් තිරිඟු පිටි නොවිකිණිය යුතු බව මේ මොහොතේ සිට බලපවත්වන පරිදි නියෝග කරමි.

(7) තිරිඟු පිටි සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධබර රාත්තලක් මීට යාකොට ඇති උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශයන් ඇතුලත සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ, එහි 5 වෙනි තීරයේ සඳහන් කර තිබෙන මිළ ගණන් වන අතරම ඒ මිළ ගණන්වලට වඩා වැඩියෙන් තිරිඟු පිටි නොවිකිණිය යුතු බව මේ මොහොතේ සිට බලපවත්වන පරිදි නියෝග කරමි.

(8) එසේම මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) තිරිඟු පිටි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ තිරිඟු පිටි වරකට ශුද්ධ බර රාත්තල් 148 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් කොයි අන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) තිරිඟු පිටි පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර රාත්තල් 148 කට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ඇ) තිරිඟු පිටි හා ඉරිඟු පිටි එකට කළවම් කළවිට එය '' තිරිඟු පිටි '' නමින් හැඳින්වෙන බවත් මෙම නියෝගයෙන් නියෝග කරමි.

(9) තවද, තිරිඟු පිටි ඉරිඟු පිටි, හැර වෙන කිසිම ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බවද මෙයින් නියම කරමි.

(10) තවද, බරින් සියයට දහයකට වැඩියෙන් ඉරිඟු පිටි කලවම් කරන ලද තිරිඟු පිටි කිසිවකු විසින් නොවිකිණිය යුතු බවද මෙයින් නියම කරමි.

(11) එසේම සහල් හා/හෝ තිරිඟු පිටි විකුණන විට එසේ විකුණනු ලබන සහල් හා/හෝ තිරිඟුපිටි යම්කිසි දෙයක ඔතනු ලැබෙනම් එහි මිලත්, මෙහි සඳහන් මිළ ගණන්වලට ඇතුලත්වන බවද නියම කරමි.

(12) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක සහල් හා/හෝ තිරිඟු පිටි සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දකුම එවැනි ද්‍රව්‍යයකින් සෑහෙන ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිල පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, එකී ද්‍රව්‍ය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බවද නියම කරමි.

(13) එසේම මෙම නියෝගයේ කාර්යය සඳහා '' රාත්තල '' හෙවත් '' රා. '' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(14) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම සහල් හා/හෝ තිරිඟු පිටි තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු සහ සහල් හා/හෝ තිරිඟු පිටි සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා අය ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය;

(ආ) විකුණූ සහල් හා/හෝ තිරිඟු පිටි ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල; සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුලත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

1965 දෙසැම්බර් මස 10 වැනි දින පූ.හා 11.30 ට රත්නපුර කච්චේරියේදී අත්සන් තබනලදී.

ජේ. වී. ඥානප්‍රගාසම්,
රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

### උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වෙනි තීරය | 4 වැනි තීරය | 5 වැනි තීරය |
|---|---|---|---|---|
| ප්‍රදේශය | සහල් ශුද්ධබර හොන්ඩරයකට අයකළ හැකි වැඩිම තොග මිළ | සහල් ශුද්ධබර රාත්තලකට අයකළ හැකි වැඩිම සිල්ලර මිළ | තිරිඟු පිටි ශුද්ධ බර රාත්තල් 148ක් තොග වශයෙන් විකිනිය හැකි වැඩිම තොග මිළ | තිරිඟු පිටි ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණීමේදී අය කළහැකි වැඩිම සිල්ලර මිළ |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| (1) නාවදුන් කෝරළේ | | | | |
| (අ) බටුගෙදර, ගලබොඩ, ලෙල්ලොපිටිය, ඇලපාත, මාරපන, ගනේගම, කරන්ගොඩ, වේරගම, පලාවෙල, හන්ගොමුව, වැලිමළුව, ගෝනකුඹුර, හකමුව, එරබද්ද, අමුණුතැන්න, බෙරුන්ඩුව, ඉළුම්බුලුව, උඩකරවිට, කරවිට, දිමියාව, දෙලොස්වල, ගල්ලැල්ල, දම්බුලුවන, බෝපැත්ත, උඩවතුපිටිය, සහ නිරිඇල්ල ... ... | 14 56 ... | 0 13½ ... | 34 39 ... | 0 24½ |

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>සහල් ශුද්ධබර හොන්ඩරයකට අයකළ හැකි වැඩිම තොග මිළ | 3 වැනි තීරය<br>සහල් ශුද්ධබර රාත්තලකට අයකළ හැකි වැඩිම සිල්ලර මිළ | 4 වැනි තීරය<br>තිරිඟු පිටි ශුද්ධ බර රාත්තල් 148ක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම තොග මිළ | 5 වැනි තීරය<br>තිරිඟු පිටි ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණීමේදී අය කළහැකි වැඩිම සිල්ලර මිළ |
|---|---|---|---|---|
| **(1) නවදුන් කෝරළේ (සම්බන්ධයි)** | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| (ආ) පැල්මඩුල්ල, සන්නස්ගම, මොරතොට, හන්දුරුකන්ද, සහ කුට්ටපිටිය ... | 14 64 | 0 13¾ | 34 50 | 0 24½ |
| (ඇ) දැල, වටාපොත, නිවිතිගල, කොළොම්බුගම, යද්දෙහිවත්ත, සහ පාතකඩ (නිවිතිගල වසම) ... | 14 60 | 0 13¾ | 34 45 | 0 24½ |
| (ඈ) වේවැල්වත්ත, කොකවියවෙල, අලුපොල, පැබොටුව, ගුරුබැවිලාගම, දෙල්වල සහ හපුගස්තැන්න ... | — | 0 14 | — | 0 25 |
| **(2) කුරුවිට කෝරළේ** | | | | |
| (අ) රත්නපුර නගර සහා ප්‍රදේශය ... | 14 56 | 0 13¾ | 34 39 | 0 24½ |
| (ආ) හිදැල්ලන, ගළුකාගම, කුරුවිට, මලන්ගම, පරකඩුව, තෙප්පනාව, මිල්ල-විටිය, දෙහිපහල, කරඳන (මැද) සහ කරඳන (උතුර) ... | 14 46 | 0 13½ | 34 26 | 0 24½ |
| (ඇ) දේවාලෙගාව, කොස්ගල, මල්වල, ගිලීමලේ, ඉඳුරුව, සහ කරඳන (පහල) | — | 0 13¾ | — | 0 24½ |
| (ඈ) ගැටහැත්ත, ඇහැලියගොඩ, එල්ලාවල, ඇරැපොල, මාවුවාගල, පොහොර-බාව, පරනගම සහ මීන්නාන ... | 14 35 | 0 13½ | 34 11 | 0 24 |
| (ඉ) කිරිඇල්ල ... | 14 70 | 0 13¾ | 34 53 | 0 24½ |
| (ඊ) වැවිල–කරඳන, ගුරුළුවාන, කරඳන (දකුණ), දෙඩම්පෙ, යටිපව්ව, එපිට වෙල, කෙටිපොල, මඩල, ඇල්ලගාවා, සහ කුරුගම්මෝදර ... | — | 0 13¾ | — | 0 24½ |
| (උ) ලස්සකන්ද ... | — | 0 14 | — | 0 24½ |
| (ඌ) ශ්‍රී පලාබද්දල ... | — | 0 14¼ | — | 0 25 |
| (එ) එරත්න ... | — | 0 14½ | — | 0 25 |
| **(3) කුකුළු කෝරළේ** | | | | |
| (අ) සිංහලගොඩ, අයගම, ගලතුර, ඇරැපෝරුව, උඩුගල, කලවාන, වේවැල් කඳුර, වැද්දගල, කුකුලේගම, පල්ලෙකන්ද, පොතුපිටිය, රඹුක සහ දෙලේකන්ද ... | 14 78 | 0 14 | 34 69 | 0 24½ |
| (ආ) කොස්වත්ත ... | 14 86 | 0 14 | 34 80 | 0 24½ |
| (ඇ) පනාපොල සහ ගවරගිරිය ... | — | 0 14¼ | — | 0 25 |
| (ඈ) පනහැටගල ... | — | 0 15 | — | 0 25½ |
| **(4) කඩවත සහ මැද කෝරළේ** | | | | |
| (අ) ඕපනායක ගම්සහා වවුම, උඩවෙල, හොරකැටිය, හුනුවල සහ අකරැල්ල... | 14 67 | 0 13¾ | 34 54 | 0 24½ |
| (ආ) බලන්ගොඩ, අමුපිටිය, බෙලිහුල්ඔය, මාවනැල්ල, මොරහැල, මාදෙල, වැලිගෙපොල, පල්ලේකන්ද, පින්නවල, රජවක, පනාන, දමහන, ඉඹුල්පෙ, විකිලිය, කෝන්ගස්තැන්න සහ බෝවත්ත ... | 14 75 | 0 14 | 34 65 | 0 24½ |
| (ඇ) මුත්තෙට්ටුවෙගම, උඩගම, ඉහල ගලගම, පල්ලේවෙල, එපිටපැත්ත, සහ හතරබාගේ ... | — | 0 14 | — | 0 24½ |
| (ඈ) කල්තොට, කොලොන්මඩ, ගල්පෙ, සහ පඹගොල්ල ... | — | 0 14 | — | 0 25 |
| (ඉ) කෙමාලියද්ද ... | — | 0 14¼ | — | 0 25 |
| (ඊ) ඌරවල ... | — | 0 14½ | — | 0 25 |
| **(5) අටකලන් කෝරළේ** | | | | |
| (අ) රක්වාන සහ පාලම්කෝච්චේ ... | 14 78 | 0 14 | 34 69 | 0 24½ |
| (ආ) ගොඩකවෙල, කොස්වැටිය, බඹරගස්තැන්න, වරායාය, වෙරහැර, හොරේ පොල, වැල්ලාව, අල්පිටිය, රිදීවිට, අම්බැවිල, පල්ලෙබැද්ද, කොස්න තොට, මස්ඉඹුල, සහ කොළඹගෙආර ... | 14 72 | 0 14 | 34 61 | 0 24½ |
| (ඇ) මාකඳුර ... | — | 0 14 | — | 0 25 |
| (ඈ) පිටවෙල ... | — | 0 15 | — | 0 25½ |
| (ඉ) කහවත්ත, වැල්අඳුර, මාදම්පෙ, අටකලන්පන්න, පනාවැන්න, පන්නිල වතුයාය, පනාපිටිය, ඕපාත, කලල්ඇල්ල, නිලදුරේ, මඩලගම සහ ඇන්දන ... | 14 64 | 0 13¾ | 34 50 | 0 24½ |
| **(6) කොලොන්න කෝරළේ** | | | | |
| (අ) ඉත්තැකන්ද, බුළුතොට, බොරළුවගෙඅයින, විජේරිය හා නැදෙල ... | 15 01 | 0 14 | 35 0 | 0 25 |
| (ආ) උල්ලිඳුවාව, කැල්ල, මිද්දෙනිය හා කොලෙංන්න ... | — | 0 14½ | — | 0 25 |
| (ඇ) ඉලුඹෙකන්ද ... | — | 0 15½ | — | 0 26 |
| (ඈ) ඇඹිලිපිටිය, විසම්තුර, පනාමුරේ සහ තුන්කම ... | 14 94 | 0 14 | 34 91 | 0 25 |
| (ඉ) හේනග්ගොඩ ... | — | 0 15 | — | 0 25 |
| (ඊ) කුඹුරුගමුව ... | — | 0 15½ | — | 0 25 |
| (උ) දපනේ ... | — | 0 15½ | — | 0 25 |

**සැලකිය යුතුයි.**—(1) මේ මිළ ගණන් විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා සහල් සහ තිරිඟු පිටි විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට වඩා වැඩියෙන් සහල් හා තිරිඟු පිටි විකිණිය නොහැක.

(2) ශුද්ධබර හොන්ඩරයකට අඩු යම්කිසි සහල් ප්‍රමාණයක් තොග වශයෙන් විකිණීමේදී ගෙවිය හැකි වැඩිම මිළ, ඉහත සඳහන් කර තිබෙන ශුද්ධ බර හොන්ඩරයක වැඩිම මිළ ප්‍රමාණයන් අනුව ගණන් බලාගත් මිළ විය යුතුය.

(3) ශුද්ධබර රාත්තල් 148 කට අඩුවෙන් හෝ වැඩියෙන් තොග වශයෙන් විකුණන තිරිඟු පිටිවල මිළ ඉහත සඳහන් ශුද්ධබර රාත්තල් 148 ක වැඩිම මිළගණන් අනුව ගණන් බලාගත් මිළ විය යුතුය.

(4) ඉහත සඳහන් කළ ප්‍රදේශවල් අතරතුර ස්ථානයන්ට එම ස්ථානයට ඉතාම කිට්ටුව සඳහන් කර ඇති මිලපාලන ප්‍රදේශයේ සඳහන් මිල බලපවත් වන බව සැලකිය යුතුයි.

12–745

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.